ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

**මොඩියුල අංකය - 05**

# නායකත්ව සංවර්ධනය සහ අධ්‍යාපන කළමනාකරණය

ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය

# ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

## මොඩියුල අංකය - 05

### නායකත්ව සංවර්ධනය සහ අධ්‍යාපන කළමනාකරණය

| මොඩියුලයේ නම | නායකත්ව සංවර්ධනය සහ අධ්‍යාපන කළමනාකරණය |
|---|---|
| මොඩියුලයේ අරමුණු | 1. නායකත්ව නිපුණතා වර්ධනය<br>උපායමාර්ගික චින්තනය, තීරණ ගැනීම, කණ්ඩායම් ගොඩනැගීම සහ ගැටුම් නිරාකරණය වැනි ප්‍රධාන නායකත්ව කුසලතා ගුරුවරුන්ට ලබා දීම.<br>2. උපදේශන නායකත්වය වැඩි දියුණු කිරිම<br>ගුරුවරුන්ට අධ්‍යාපනික භාවිතයන් මෙහෙයවීමට, සෙසු ගුරුවරුන් සමග සහයෝගිතාවට සහයවීමට සහ සිසුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල වැඩි දියුණු කිරීමට හැකියාව ලබා දීම.<br>3. සදාචාරාත්මක නායකත්වය පෝෂණය කිරීම.<br>පුද්ගලික සහ වෘත්තීය සංවර්ධනය තුළ ස්වයං දැනුම්වත්භාවය, සදාචාරාත්මක තීරණ ගැනීම ප්‍රවර්ධනය කිරීම.<br>4. අධ්‍යාපන ප්‍රතිපත්ති සහ පරිපාලනය අවබෝධ කර ගැනීම.<br>පාසල් කළමනාකරණ ව්‍යුහයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සහ නායකත්ව භූමිකාවන් සඳහා ඒවායේ ඇඟවුම් පිළිබඳව ගුරුවරුන්ට දැනුමක් ලබා දීම.<br>5. වෙනස්වීම් කළමනාකරණ කුසලතා ශක්තිමත් කිරීම.<br>විශේෂයෙන් අධ්‍යාපනික ප්‍රතිසංස්කරණ හෝ නවෝත්පාදනයන්ට ප්‍රතිචාර වශයෙන් පාසල්තුළ වෙනස්වීම් මුලපිරීම් මෙහෙයවීමට සහ කළමනාකරණය කිරීමට ගුරුවරුන් සූදානම් කරවීම.<br>6. සහයෝගී නායකත්වය (Collaborative Leadership) ප්‍රවර්ධනය කිරීම.<br>කණ්ඩායම් ක්‍රියාකාරිත්වය, වෘත්තීය ඉගෙනුම් ප්‍රජාවන් සහ  පාසල් සංවර්ධනයේ කොටස්කරුවන්ගේ සහභාගිත්වය දිරිමත් කිරීම.<br>7. කාලය සහ සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම.<br>පාසල් මෙහෙයුම් ප්‍රශස්ත කිරීම සඳහා ඵලදායි සැලසුම් කිරීම, ප්‍රමුඛතාකරණය සහ සම්පත් වෙන් කිරීමේ උපායමාර්ග ඉගැන්වීම.<br>8. දත්ත පදනම් කරගෙන තීරණ ගැනීම.<br>උපදේශන සහ පරිපාලන තීරණ දැනුම් දීම සඳහා දත්ත සහ සාක්ෂි භාවිත කිරීමට ගුරුවරුන් යොමු කිරීම.<br>9. අනාගත නායකත්ව භූමිකා සඳහා ධාරිතාව ගොඩ නැගීම.<br>දෙපාර්තමේන්තු ප්‍රධානීන්, සම්බන්ධීකාරකවරුන් සහ විදුහල්පතිවරුන් ඇතුලු මධ්‍යම සහ ජ්‍යෙෂ්ඨ නායකත්ව තනතුරු සඳහා ගුරුවරුන් සූදානම් කිරීම.<br>10. දුරදර්ශී සහ පරිවර්තනීය නායකත්වය දිරිමත් කිරීම.<br>අධ්‍යාපන විශිෂ්ටත්වය සඳහා පැහැදිලි දැක්මක් වර්ධනය කර සන්නිවේදනය කිරීමට සහ පද්ධතිමය වැඩි දියුණු කිරීම් සඳහා ගුරුවරුන් පෙළඹවීම. |

| | |
|---|---|
| අපේක්ෂිත ඉගෙනුම් පල | 1. නායකත්ව න්‍යායන් පිළිබඳ අවබෝධයක් පෙන්නුම් කර ඒවා සැබෑ ලෝක අධ්‍යාපන සැකසුම්වලට අදාළ කර ගනියි.<br>2. ඉගැන්වීමේ තාක්ෂණය වැඩි දියුණු කිරීමේ දී සහ සිසුන්ගේ ප්‍රතිඵල වැඩි දියුණු කිරීමේ දී උපදේශන නායකත්වයේ කාර්යභාරය විශ්ලේෂණය කරයි.<br>3. සැලසුම් කිරීම, සම්පත් වෙන් කිරීම සහ කාල කළමනාකරණය ඇතුලුව ඵලදායී පාසල් කළමනාකරණයේ මූලධර්ම භාවිත කරයි.<br>4. අධ්‍යාපන ප්‍රතිපත්ති සහ පාලන ව්‍යුහයන් විවේචනාත්මකව ඇගයීමට ලක් කර, පාසල් නායකත්වය සහ පන්ති කාමර භාවිතය කෙරෙහි ඒවයේ බලපෑම පැහැදිලි කර ගනියි.<br>5. පාර්ශවකරුවන්ගේ සහයෝගී තීරණ ගැනීම ඇතුළත් කරමින්, පාසල් දියුණුව සඳහා මුලපිරීම් සැලසුම් කරයි.<br>6. නායකත්ව තීරණ දැනුම් දීමට සහ ආයතනික කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට දත්ත සහ ශාක්ෂි මත පදනම් වූ උපාය මාර්ග භාවිත කරයි.<br>7. කණ්ඩායම් මෙහෙයවීමේ දී සහ වෙනස්කම් කළමනාකරණය කිරීමේ දී ශක්තිමත් සන්නිවේදනය, අන්තර් පුද්ගල සහ ගැටුම් නිරාකරණ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>8. සමානාත්මතාව, විවිධත්වය සහ ශිෂ්‍ය කේන්ද්‍රිය ඉගෙනීමේ වටිනාකම් සමග පෙළගැසුණු සදාචාරාත්මක සහ දූරදර්ශී නායකත්වය ප්‍රවර්ධනය කරයි. |
| මොඩියුලයේ අන්තර්ගතය | 1.0 නායකත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?<br>1.1 නායකත්වය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන අධ්‍යයනය<br>1.2 නායකත්වයේ ස්වභාවය සහ ලක්ෂණ<br>1.3 නායකත්වයේ කාර්යභාරය<br>1.4 විවිධ නායකත්ව ශෛලින්<br>1.5 නායකත්ව අභියෝග<br>1.6 උපදේශන නායකත්වය<br>1.7 විසිඑක්වන සියවසේ නායකයාගේ ගති ලක්ෂණ<br><br>2.0 පෞරුෂය යනු කුමක් ද?<br>2.1 පෞරුෂය පිළිබඳ නිර්වචන අධ්‍යයනය<br>2.2 පෞරුෂ සංවර්ධනය<br>2.3 පෞරුෂ සංවර්ධනයේ ස්වභාවය<br>2.4 පෞරුෂ සංවර්ධන උපායමාර්ග<br>2.5 ගුරුවරුන්ගේ පෞරුෂ සංවර්ධනය කිරීමේ වැදගත්කම<br><br>3.0 කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?<br>3.1 කළමනාකරණය පිළිබඳ නිර්වචන අධ්‍යයනය<br>3.2 කළමනාකරණ න්‍යායන් හා ඒවායේ පසුබිම<br>3.3 විවිධ කළමනාකරණ ශෛලින් හඳුනා ගැනීම<br>3.4 වෙනස්වීම් කළමනාකරණය<br>3.5 ජෝන් කොටර්ගේ (Jhon P. Kotter) වෙනස්වීම් ආකෘතිය |

| | |
|---|---|
| | 3.6 වෙනස්වීම් කළමනාකරණයේ ඇති වැදගත් ලක්ෂණ<br>3.7 වෙනස්වීම් කළමනාකරණයේ මූලිකාංග<br><br>4.0 අධ්‍යාපන කළමනාකරණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?<br>4.1 අධ්‍යාපන කළමනාකරණයේ කාර්යභාරය<br>4.2 අධ්‍යාපන කළමනාකරණය සහ අධ්‍යාපන පරිපාලනය අතර වෙනස<br>4.3 කළමනාකරණ සංකල්ප අධ්‍යාපන සංවර්ධනය සඳහා යොදාගත හැකි ආකාරය<br>4.4 පන්ති කාමර කළමනාකරණයේ දී භාවිත කළ හැකි කළමනාකරණ එළඹුම් (Approaches)<br>4.5 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අධ්‍යාපන කළමනාකරණයේ ඇති වැදගත්කම<br><br>❖ ඉහත අන්තර්ගතයට අදාළ ව වැඩිදුර අධ්‍යයනය නිර්දේශ කෙරේ. |
| ඉගැන්වීමේ ක්‍රමවේදය | ස්වයං අධ්‍යයනය |